මීගමුව මහා නගර සභාව

----------------------------

ගම්පහ දිස්ත්‍රික්කය

--------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 සැප්තැම්බර් 08 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 30 දින ද නගරාධිපතිවරයාට යවා ඇත.

1.2 අහිතකර මතය

----------------

මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට මීගමුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 අහිතකර මතය සඳහා පදනම

-------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) බාහිර ආයතනවල ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂයේ ගිවිසුම් ගත වූ රු.17,169,892 ක් වූ ව්‍යාපෘති 23 ක් වෙනුවෙන් මුදල් ලැබී ගෙවීම් කර තිබුණේ 2020 වර්ෂයේදී වුවද සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල ඒවා ලැබිය යුතු හා ගෙවිය යුතු ලෙස දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේ දී එසේ කටයුතු කරන බව දන්වමි. |
| (ආ) කෘෘකැබ් රථයක් හා ජෙනරේටරයක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු ලෙස පිළිවෙලින් රු.5,203,860 ක් හා රු.5,000,000 ක් ගිණුම්ගත කර තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් එවැනි මිලදී ගැනීමක් සිදුකර නොතිබූ හෙයින් ගිණුම්වල රු.10,203,860 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වැල්ලවීදිය බාල්දිකොටුව ක්‍රීඩාපිටිය බොරළු යොදා සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2018 දෙසැම්බර් 31 දින රු.1,901,077 ක් ගෙවීම් කර තිබුණද 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ලෙස රු.2,001,160 ක් වූ මුළු මුදලම දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.2,988,800 ක් වූ යන්ත්‍ර හා උපකරණ අයිතම 03 ක්, 2018 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.9,279,600 ක් වූ ට්‍රැක්ටරයක් හා 2017 දෙසැම්බර් 18 දින පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ Compost pellet යන්ත්‍රයද ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ නිකුත් කිරීමේ නියෝග නිකුත් කර නොමැති බැවින් ප්‍රාග්ධනිත කිරීම සිදුකර නැති බව දන්වමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ පුස්තකාල පොත්වල වටිනාකම රු.965,598 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඊ) | 2018 හා 2019 වර්ෂවලදී ණය පදනම මත මිලදී ගෙන තිබූ කම්පැක්ටර් රථ 07 ක් හා ට්‍රැක්ටර් 08 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු. 31,439,368 ක් වූ ණය වාරික ප්‍රාග්ධනිත කර තිබූ නමුත් වත්කම් මිලදී ගැනීමේ වියදම ගිණුම්වලට ගැලපීම් කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (උ) | විනෝද බදු, ප්‍රචාරක දැන්වීම් ගාස්තු හා නාගරික මන්ත්‍රී වැටුප් සඳහා ඉදිරියට ලැබූ එකතුව රු.235,670 ක් හිඟ ශේෂවලින් අඩුකර අනුචිත ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය තුළ වරිපනම් අතිරේක හර වශයෙන් දක්වා තිබූ මුදල, වරිපනම් වැඩ සටහනට අනුව රු.4,287,325 ක් වුවද ගිණුම්වල රු.29,287,325 ක් වශයෙන් දක්වා එය මෙහෙයුම් කිරීමේදී ලද වාසි ගිණුමට ජර්නල් සටහන් මඟින් මාරු කර තිබීම නිසා එම ආදායම් ගිණුම රු.25,000,000 ක් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් ඌනතාවයක් විය යුතු ආදායම් හා වියදම් ගිණුම අතිරික්තයක් වී තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඵ) | ඉකුත් වර්ෂයේදී ඉදිරියට ලද වරිපනම් රු.6.834,022 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කිරිමේදී රු.10,448,332 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | අවසාන ගිණුම සඳහා නිවැරදි ගිණුම් තැබීමක් සිදුකර ඇති බව දන්වමි. |
| (ඒ) | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශයන්ට අනුව අපහරණය කළ පිරිවැය හඳුනාගෙන නොමැති වත්කම් හා 2013,2016 හා 2018 යන වර්ෂයන්ට අදාලව සිදුකර තිබූ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශයන්ට අනුව අපහරණය කල රු.16,780,000 ක් වූ වාහනවල පිරිවැය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | පිරිවැය හඳුනාගත් පසු ඉවත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඔ) | සමාලෝචිත වර්ෂයට අදාලව වරිපනම් දේපල නව තක්සේරු කිරීම්, සංශෝධනයන් හා වෙනත් කරුණු මත හඳුනාගෙන තිබූ රු.29,287,325 ක් වූ වරිපනම් බිල් කිරීම් වෙනත් ආදායම් ප්‍රභවයක් ලෙස අනුචිත ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | පරික්ෂා කර බලා ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඕ) | 2018 වර්ෂයේ කම්පැක්ටර් රථ 02 ක අඩුවෙන් සටහන් කිරීම නිවැරදි කිරිම සඳහා රු.29,384,000 ක් අයකර ගත හැකි උපයෝගි සේවා ගිණුම හර කර සමුච්චිත අරමුදල බැර කළ යුතු වූවත් සමුච්චිත අරමුදල හර කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | පරික්ෂා කර බලා ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ක) | නොලැබෙන ආදායම් ලෙස සලකා හිඟ හිටි ආදායම් ගිණුමින් හා සමුච්චිත අරමුදලින් කපාහරින ලද රු.7,822,379 ක් නැවතත් සමාලෝචිත වර්ෂයේ ආදායමට හා හිඟහිටි ආදායම් ගිණුමට ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | පරික්ෂා කර බලා ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ග) | බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලයෙන් සභාවට පැවරුණ ඒත්තුකාල ජල උද්‍යානය බදු දීමෙන් ලැබෙන මුදලින් මණ්ඩලයට ගෙවිය යුතු සියයට 30 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | පරික්ෂා කර බලා ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.3.2 **නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 12 ක ශේෂයන් හා ඒවාට අදාළ උපයෝගී ලේඛන අතර රු.19,350,307 ක වෙනස්කම් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පරික්ෂා කර බලා ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ආදායම් විෂයයන් දෙකක ශේෂයන් හා ඒවාට අදාළ උපයෝගී ලේඛන අතර රු.6,652,117 ක වෙනස්කම් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට භෞතික තොග ශේෂය හා තොග ගිණුම අතර වෙනසවූ රු.62,534,989 න් රු.51,746,189 ක් තොග ගැලපුම් ගිණුමකට මාරු කර ඉතිරි රු,10,788,800 ක වෙනසක් තව දුරටත් පැවතුණු අතර තොග ගැලපුම් ගිණුමද නිරාකරණය කර නොතිබුණි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු ගිණුම් | | |
| (i) | පෙර ගෙවුම් ශේෂය තුළ ඇතුළත් අගරු චෙක්පත් වටිනාකම වන රු.980,270 කින් රු.736,093 ක් වසර 10 කට වැඩි චෙක්පත් වූයෙන් ඒවා නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබු අතර රු.254,920 ක් වූ චෙක්පත් 07 ක් හිමිකරුවෙකු සඳහන් කර නොමැති චෙක්පත් විය. | අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පරික්ෂා කර බලා ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | ගබඩා ණයගැති ශේෂය වූ රු.5,099,478 තුළ අවුරුදු 10 ට වැඩි ණයගැතියන් රු.1,137,229 ක් හා අවුරුදු 05 ත් 10 ත් අතර ණයගැතියන් රු.2,456,847 ක් විය. | අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පරික්ෂා කර බලා ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | |
|---|---|---|
| (iii) විවිධ ණයගැති ශේෂය වූ රු.2,585,007 තුළ වසර 10 ඉක්මවූ ණයගැතියන් රු.2,152,495 ක් විය. | අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පරික්ෂා කර බලා ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (iv) වරිපනම් දේපල 2 ක් වෙනුවෙන් ලැබී අගරු වී තිබූ 2019 මාර්තු 29 දිනැති රු.129,100 ක චෙක්පතට අදාළ මුදල් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයකර ගැනීමට පියවර ගත් නමුත් එය අසාර්ථක වූ අතර ඒ අනුව ගිණුම නිවැරදි කිරීමට පියවර ගන්නා ලද බව දන්වමි. |
| (v) හිඟ සතිපොළ ගාස්තු ආදායම් රු.1,668,244 කින් රු.559,554 ක් 2010 වර්ෂයට පෙර කාලයට අදාල විය. | අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයකර ගැනීමට පියවර ගන්නා බව දන්වමි. |

(ආ) ගෙවිය යුතු ගිණුම්

-------------------

| | | |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට රු.37,310,029 ක් වූ ගබඩා ණයහිමි ශේෂය තුළ වසර 5 ඉක්මවූ ශේෂය රු.17,981,758 ක් විය. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | පරික්ෂා කර බලා ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු. 2,868,097 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාලව පිළිගත හැකි සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. | පරික්ෂා කර බලා ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

### 1.3.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2013 වර්ෂයේ සිට පැවත එන හිඟ තානායම් ගාස්තු රු.147,345 ක් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව කපා හැර තිබුණි. | විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතුවේ. | ලේඛන නිවැරදි කිරීමට සභාවේ අනුමැතිය මත කටයුතු කර ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයට අදාලව බදු සහන සහා අනුමැතිය ලබාදීම මත රු. 9,827,721 ක වටිනාකමක් සහා අනුමැතියකින් තොරව කපා හැර තිබුණි. | ලබා ගත යුතුවේ. | 2020 ජනවාරි මස සිට සහා අනුමැතිය ද ලබා ගැනීමට කටයුතු කරමින් පවති. |
| (ඇ) සභාවේ නිලධාරියකුට නිකුත් කළ අත්තිකාරම් රු.1,358,785 ක් පියවීම් කර නොතිබියදී දිවුරුම් පෙත්සම් ඉදිරිපත් කොට පියවූවා සේ සලකා සමුච්චිත අරමුදලට කපා හැර තිබුණි. | තහවුරු කරන ලද සාක්ෂි මත පියවීම් කළ යුතුවේ. | පරීක්ෂා කර බලා ඉදිරියේ දී වාර්තා කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.4 අනුකූල නොවීම්

-----------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

-----------------------------------------------------------------------

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) මහා නගර සහා ආඥා පනතේ (252 අධිකාරය) 218 වගන්තිය | මුදල් වර්ෂයක් අවසානවූ පසු ඒ වර්ෂය තුළදී නගර සභා අරමුදලින් ගෙවීම් හා අරමුදලට ලැබීම් පිළිබඳ ප්‍රකාශයක් සභාවට ඉදිරිපත් කර නොතිබුණි. | පනතේ සඳහන් නීති පිළිපැදීම කෙරෙහි කළමනාකරණ යේ අවධානය යොමු කරවමි. | මාසික ප්‍රකාශනයේ සාරාංශ වාර්තාවක් මුදල් වර්ෂ අවසාන වූ පසු ඉදිරියේ දී සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) මුදල් රෙගුලාසි 371(2) | 1986 වර්ෂයේ සිට ලබාදී තිබු රු.5,099,478 ක අත්තිකාරම් මුදලක් පියවීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | පරීක්ෂා කර බලා ඉදිරියේ දී වාර්තා කරන බව දන්වමි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | වසර 2 ඉක්මවා තිබූ රු.3,277,857 ක් වටිනා තැන්පත් ශේෂ හඳුනා ගෙන නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | වසර 02 ඉක්මවා ඇති අනෙකුත් තැන්පත් මේ දක්වා නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) බස්නාහිර පළාතේ 2008 අංක 01 දරන නාගරික සහ අපද්‍රව්‍ය කළමනාකරණ රීති අංක 16,50,52 හා 56 | අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතුවලදි අදාල රීති පරිදි කටයුතු කර නොතිබුණි. | අදාල රීති අනුගමනය කළ යුතුවේ. | කසළ එකතු කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කර ඇති අතර කසල ප්‍රමාණය පිළිබඳව වාර්තා පවත්වාගෙන යාම සිදුකරනු ලබයි.කසළ රෙදි වලින් ආවරණය කරන |

| | | | | |
|---|---|---|---|---|
| | | | | අතර නොදිරන අපද්‍රව්‍ය පුත්තලම ඉන්සී සමාගම වෙත යොමු කරන බව දන්වමි. |
| (ඇ) | 2019 හා 2020 වර්ෂවලට අදාළව බසාර් II කොට්ඨාශයේ හා තලාහේන ප්‍රදේශයේ කසළ බැහැර කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ එළඹ තිබූ ගිවිසුමේ කොන්දේසි අංක 05,06,08 හා 16 | එළඹ තිබූ ගිවිසුමේ අදාල කොන්දේසි කඩ කර තිබූ නමුත් ගිවිසුම අවසන් කර නොතිබුණි | ගිවිසුම් පරිදි කටයුතු කර ගැනීම කෙරෙහි කළමනාකරණ යේ අවධානය යොමු කළ යුතුවේ. | ගිවිසුම අනුව මේ වන විට කටයුතු සිදු කරනු ලබන බව දන්වමි. |

2. මූල්‍ය සමාලෝචනය
---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 181,543,820 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.273,610,198 ක් විය.

2.2 මූල්‍ය පාලනය
-----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහා නගර සභාව විසින් දිගින් දිගටම අයිරා පහසුකම් ලබා ගෙන තිබූ අතර 2019 දෙසැම්බර් 31 වන විට බැංකු අයිරාව රු.33,575,589 ක් දක්වා වර්ධනය වී තිබුණි. මෙලෙස දිගින් දිගටම අයිරා පහසුකම් ලබා ගැනීම මහා නගර සභා ආඥා පනතේ 206(1) වගන්තියේ ප්‍රතිපාදනවලට අනුගත නොවීමක් විය. | යහපත් මූල්‍ය පාලනයක් පවත්වා ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුවේ. | 2019 ජනවාරි 24 දින සහ 2019 අගෝස්තු 07 දින ප්‍රධාන කළමනාකරණ සහකාර නිර්දේශ අනුව බැංකු අයිරා ලබාගෙන ඇති බව දන්වමි. |
| (ආ) | අයිරා පහසුකම් සඳහා පොලී අනුපාතයක් සියයට 13.25 ක් හා ණය මුදලක් සඳහා පොලී අනුපාතය සියයට 12.75 ක් බව දැනුවත්ව තිබියදී සියයට 13.25 ක පොලී අනුපාතයක් යටතේ අයිරා පහසුකම් ලබා ගෙන 2007 සිට 2018 වර්ෂය දක්වා රු.14,256,116 ක් හා 2019 වර්ෂය සඳහා රු.1,387,685 ක් වශයෙන් අයිරා පොලී ගෙවීමට සිදුව තිබුණි. | සභාවට වඩාත් වාසිදායක ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුවේ. | පරීක්ෂා කර බලා ඉදිරියේ දී වාර්තා කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභා අරමුදල් මගින් සිදු කරනු ලබන ව්‍යාපෘති 29 ක් සඳහා රු.54,200,000 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේ අයවැය මගින් වෙන්වී තිබුණද රු. 88,907,923 ක් වූ ගිවිසුම් 23 කට එළඹ තිබූ හෙයින් ප්‍රතිපාදන ඉක්මවා රු.34,707,923 ක් දරා තිබුණි. | යහපත් මූල්‍ය පාලනයක් පවත්වා ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුවේ. | පරීක්ෂා කර බලා ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

2.3 ආදායම් පරිපාලනය

----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

----------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | --------- | --------- | --------- | --------- | ----------- | ----------- | --------- | ------- | ---------- |
| | | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. |
| (i) | වරිපනම් හා බදු | 171,296 | 165,026 | 106,338 | 126,585 | 147,458 | 169,807 | 169,484 | 109,892 |
| (ii) | කුලී | 35,932 | 34,470 | 29,582 | 19,099 | 39,640 | 37,378 | 34,859 | 19,867 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 71,040 | 60,723 | 59,263 | 4,625 | 59,063 | 62,890 | 61,345 | 5,418 |
| (iv) | වෙනත් ආදායම් | 339,998 | 387,779 | 318,830 | 70,723 | 288,638 | 440,246 | 335,652 | 109,257 |
| | | 618,266 | 647,998 | 514,013 | 221,032 | 534,799 | 710,321 | 601,340 | 244,434 |
| | | ======= | ====== | ===== | ======= | ======= | ====== | ====== | ======= |

2.3.2 වරිපනම් හා බදු

-----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ----------- | ---------------------------- |
| (අ) | කොච්චිකඩේ උප කාර්යාලයේ ලේඛන අනුව 2019 ජනවාරි 01 දිනට අයවිය යුතු රු.9,905,000 ක වරිපනම් ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.3,921,797 ක් පමණක් අයවී තිබූ අතර එය සමස්ථ හිඟයෙන් සියයට 39.5 ක් විය. | හිඟ අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 අප්‍රේල් 21 දින ඇති වූ පාස්කු ප්‍රහාරය නිසා අපේක්ෂිත ආදායම් ඉලක්කය කරා ලඟා වීමට නොහැකි වී ඇති බව දන්වමි. |
| (ආ) | ප්‍රධාන කාර්යාලයේ ලේඛන අනුව 2019 ජනවාරි 01 දිනට අයවිය යුතු රු.87,769,094 ක ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.39,614,518 ක් පමණක් අයවී තිබූ අතර එය සමස්ථ හිඟයෙන් සියයට 45 ක් විය. | හිඟ අයවීම් පසුවිපරම් කටයුතු සිදුකළ යුතුවේ. | ජංගම සේවා 06 ක් ද පවත්වා වරිපනම් හිඟ අය කිරීමට කටයුතු කළද හිඟ ගෙවීමට බදු කරුවන්ගේ වැඩි උනන්දුවක් නොමැති බව දන්වමි. |

2.3.3 කුලී

----

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ඒත්තුකාල වෙරළ උද්‍යානය රථගාල් ගාස්තු අයකිරිම සහ වැසිකිලි පද්ධතිය නඩත්තු කිරිමේ බදුකරය 2003 වර්ෂයේ සිට එකම පුද්ගලයෙකුට පිරිනමා තිබූ අතර 2018 වර්ෂයේ බදු මුදලට සියයට 10 ක් වැඩිකර 2019 වර්ෂය සඳහා රු.2,244,000 ක වාර්ෂික මුදලකට, ටෙන්ඩර්කරුගේ ඉල්ලීම මත බදු දී තිබුණි.මෙහිදී ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමකින් තොරව ටෙන්ඩර්කරු තොරාගෙන තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතුවේ. | මුදල් කාරක සභා හා සභා තීරණ අනුව කටයුතු කර ඇති බව දන්වමි. |
| (ආ) | මීගමුව ඒත්තුකාල ජල උද්‍යානය නඩත්තු හා මෙහෙයුම් කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය නොකර දැනට එහි පාලන කටයුතු සිදුකරනු ලබන අයගේ ඉල්ලීමට 2019 පෙබරවාරි 22 දින සිට තක්සේරුවක් නොකොට රු.100,000 ක මාසික ගාස්තුවක් යටතේ ලබාදීමට තීරණය කර තිබුණද ඒ සඳහා ගිවිසුමකට එළඹ නොතිබුණි.කොන්දේසි ප්‍රකාර දින 07 ක් ඇතුලත කාර්යසාධන බැදුම්කරයක් ඉදිරිපත් කල යුතු අතර මාසික මුදල ඊලඟ මස 10 දිනට ගෙවිය යුතු විය.එහෙත් කාර්යසාධන ඇපකරය 2019 අප්‍රේල් 21 දින ලබා ගෙන තිබුණි. 2019 දෙසැම්බර් මස මාසික ගාස්තු ලබා ගෙන නොතිබූ අතර කාර්යසාධන ඇපකරය 2020 පෙබරවාරි 14 දින මුදල් කරගෙන තිබුණද අයවිය යුතු දඩ මුදල් ලබාගෙන නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අඩුපාඩු සම්පූර්ණ කර ටෙන්ඩර් කර බදුකරුවකු තොරා ගන්නා තෙක් 2019 මාර්තු 07 දිනැති මහා සභා අනුමැතිය යටතේ අනුමැතිය ලබාදී ඇති බව දන්වමි. |
| (ඇ) | කාමච්චෝඩය ඉරිදා පොළ හා බදාදා පොළ බදුදීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව වාර්ෂික බදු මුදලට සියයට 10 ක් එකතු කර බදු දී තිබූ අතර 2019 වර්ෂයෙන් අඩකටත් වඩා වැඩි කාලයක් ගිවිසුම් ගතවීමකින් තොරව බදු මුදල් රැස් කිරීමට ඉඩදී තිබුණි.ඉරිදා පොළ හා බදාදා පොළ සඳහා 2019 වර්ෂය සඳහා තැන්පත් මුදල් පිළිවෙලින් රු.205,269 ක් හා රු.150,335 ක් අඩුවෙන් ලබාගෙන තිබූ අතර 2019 වර්ෂයේ ගිවිසුම්ගත මුදල හා රැස්කර තිබූ ආදායම අතර වෙනස පිළිවෙලින් රු.1,863,840 ක් හා රු.1,055,024 ක් වී තිබුණි. ඒ අනුව රු.2,918,864 කින් සභා අරමුදලට පාඩු සිදුව තිබුණි. | සභාවට වඩා වාසිදායක වන පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුවේ. | මුදල් කාරක සභා හා සභා තීරණ අනුව කටයුතු කර ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නව බස් නැවතුම් පොළ සාප්පු සංකීර්ණයේ දෙවන මහලේ විවෘත ශාලාව බදුදීමට අදාලව 2012 වර්ෂයේදී රු.1,313,025 ක් ,ලැබී තිබූ අතර ශාලාවේ අඩුපාඩු නිවැරදි කරදී විධිමත් පරිදි ගිවිසුමකට එළඹ ආදායම රැස්කර ගැනීමට වර්ෂ 07 ක් ගතවනතුරුත් සභාවට නොහැකිවී තිබුණි. 2012 වර්ෂයේ ලැබී තිබූ ඉහත මුදලද බදුකරුට ආපසු ගෙවා තිබිමෙන් සහා අරමුදලට පාඩු සිදුකර තිබුණි. | විධිමත් ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුවේ | අදහස් දක්වා නොමැත. |

2.3.4 බලපත්‍ර ගාස්තු
---------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කසළ අංගණයට පිටුපස කොටසේ මාඔයට මායිම්ව පැවති ඌරු කොටු 04 ක් සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ අවධානය යොමු විය යුතුවේ. | පරීක්ෂා කර බලා පසුව නිවැරදි කරන බව දන්වමි. |
| (ආ) | 2019 වර්ෂයට අදාල තලාහේන හා කොච්චිකඩේ උප කාර්යාල බල ප්‍රදේශයන්හි පවත්වා ගෙන යනු ලබන පොදු ලැගුම්හල් 10 කින් වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. | පරීක්ෂා කර අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පරීක්ෂා කර බලා පසුව නිවැරදි කරන බව දන්වමි. |
| (ඇ) | තලාහේන උප කාර්යාලයට අයත් ප්‍රදේශයේ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචිකර තිබූ කාමර සංඛ්‍යාව 20 කට වඩා අඩුවූ හෝටල් 02 ක් සඳහා සමාලෝචිත වර්ෂයට පරිසර බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | පරීක්ෂා කර අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පරීක්ෂා කර බලා පසුව නිවැරදි කරන බව දන්වමි. |
| (ඈ) | මහා නගර සභා ආඥාපනතේ 247 (අ) (2) හි විධිවිධානවලට පටහැනිව සංචාරක මණ්ඩල පනත යටතේ ලියාපදිංචි හෝටල් සඳහා කාමර පදනම මත ගාස්තුවක් අයකර තිබීම නිසා එම හෝටල් තුළ පවත්වාගෙන යනු ලබන වෙනත් ආදායම් ප්‍රභවයන් වන රට බීම විකුණුම් ආදායම්, ක්‍රීඩාගාර ගාස්තු, ආයුර්වේද පංචකර්ම ප්‍රතිකාර වැනි ආදායම් මුළුමනින්ම නොසලකා හැර තිබූ අතර එම ආදායම් ප්‍රභවයන් සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | වෙනත් ආදායම් ප්‍රභවයන්ගෙන් ගාස්තු අය කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුවේ. | පරීක්ෂා කර බලා පසුව නිවැරදි කරන බව දන්වමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

මහා නගර සභා ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබවිහරණය පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කුණු කසළ වෙන් කොට සහා සීමාව තුළ එකතු කිරීම හා සභාවේ විද්‍යුත් පළාත් පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම යන දර්ශකවලින් කසළ වෙන් කොට ලබා ගන්නේ බල ප්‍රදේශයේ මුළු කොට්ඨාශ 20 න් කොට්ඨාශ 07 ක පමණක් වන අතර සභාව තුළ විද්‍යුත් පළාත් පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සිදු කොට නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාකාරකම් ඉටු කිරීම කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | කොම්පෝස්ට් පොහොර අලෙවි සැල් 02 ක් තලාහේන හා කොච්චිකඩේ ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද එය ආරම්භ කර නොතිබු අතර කොම්පෝස්ට් පොහොර අලෙවි කිරීමේ ජංගම සේවාවන් විශේෂ උත්සව අවස්ථාවල නගර සීමාව තුළ හා බස් නැවතුම අසල ආරම්භ කිරීමට සැලසුම් කළ ද එය ආරම්භ කර නොතිබුණි. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්ති සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමු කළ යුතුවේ. | නිෂ්පාදනයේ අතිරික්තයක් නොතිබූ බැවින් මේ පිළිබඳ අවධානය යොමු කර නැති බව දන්වමි. |
| (ii) | නොදිරන අපද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීමට සැලසුම් කළද එය ක්‍රියාත්මක කර නොතිබු අතර 2019 වර්ෂයේදි බස්නාහිර පළාත් පළාත් පාලන අමාත්‍යාංශයේ ඝණ අපද්‍රව්‍ය සහායක මධ්‍යස්ථානයෙන් ආධාර ඉල්ලා නොතිබුණි. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්ති සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමු කළ යුතුවේ. | ප්‍රතිපාදන ලබා නොදිම මත එම කාර්ය ඉටු කිරීමට නොහැකි වූ බව දන්වමි. |

(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හඳුනාගෙන තිබූ තිරසාර පරිභෝජන සහ නිශ්පාදන රටාවන් සහතික කිරීම හා සියල්ලන් සඳහාම පෝෂිත පරිපූරණ තිරසාර ආර්ථික වර්ධනය ,පූර්ණ ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය යන තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්කයන්ගේ ප්‍රගතිය සියයට 20 ක මට්ටමක පැවතිණි. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 අප්‍රේල් 21 දින සිදුවූ පාස්කු ප්‍රහාරය හේතුවෙන් 2019 වර්ෂයට අදාළව සැලසුම් කළ වැඩසටහන්වලින් මුල් කාර්තුවට අදාළව සැලසුම් කළ වැඩසටහන් පමණක් අවසන් කළ හැකි වූයෙන් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බවත් අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 20 ක් පමණක් සපුරා ගැනීමට හැකි වූ බවත් දන්වමි. |

(ඈ) ප්‍රතිපාදන නොසැලසීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුන්නක්කරය ධීවර බෝට්ටු නවතින ස්ථානයේ ආවරණ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ආයතනයක් සමඟ 2019 ඔක්තෝබර් 18 දින රු.7,758,405 ක වටිනාකමකට ගිවිසුම්ගතව තිබුණි.2019 සැප්තැම්බර් 16 දින වන තාක්ෂණික ඇගයීම් කමිටු දිනය වන විටත් ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කරවා ගෙන නොතිබූ අතර කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුම් අත්සන් කිරීමේ දින සිට දින 14 ක් ඇතුලත ව්‍යාපෘතිය ආරම්භ කල යුතු වුවත් 2020 ජුනි 30 දින වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම ව්‍යාපෘතිය ටෙන්ඩර් කරන අවස්ථාවේදී ප්‍රතිපාදන සපයා ගෙන නොතිබූ අතර වැය ශීර්ෂ මාරුවකින් ප්‍රතිපාදන වෙන්කරගෙන ඇත. ධීවරයින්ගේ ගැටලුවක් පැන නැගී ඇති බැවින් එම ගැටළුව විසඳන තෙක් තාවකාලිකව මෙම ඉදිකිරීම නවතා ඇති බව දන්වමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) තලාහේන හා බසාර් II කොට්ඨාශය හා තලාහේන ප්‍රදේශයේ කසළ එකතු කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත පවරා තිබූ අතර එම කසළ, සභාවේ කසළ බැහැර කරන භූමියට බැහැර කිරීමට අවසරදී මසකට රු.50,000 ක ගාස්තුවක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කර තිබුණි. 2019 ජනවාරි සිට ජුනි මස දක්වා පෞද්ගලික ආයතනයක් විසින් | සභාවට වාසිදායක වන අකාරයේ තීරණවලට එළඹ යුතුවේ. | මසකට රු. 50,000 ක ගාස්තුවක් අය කිරීමට 2018 අගෝස්තු 02 දිනැති මහා සභා සම්මුතියෙන් පිළිගෙන ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| | බැහැර කර තිබූ කසළ ට්‍රැක්ටර් ලෝඩ් ගණන 953 ක් විය. එම කාලපරිච්ඡේදය තුළ බොරළු සැපයීම හා කසළ මත බොරළු තුනී කිරීම සඳහා රු.7,110,632 ක් වැයකර තිබූ අතර ඒ අනුව පෞද්ගලික ආයතනය විසින් ගෙන එන කසළ වෙනුවෙන් සභාව විසින් මසකට දරන වියදම රු.192,698 ක් විය. එහෙත් එම ආයතනයෙන් අයකර තිබුණේ රු.50,000 ක් වන හෙයින් මසකට රු.142,698 ක පමණ පාඩුවක් සිදුවීමෙන් 2019 ජනවාරි සිට ජුනි දක්වා වූ මුළු පාඩුව රු.856,188 ක් විය. | | |
| (ආ) | සභාව සම්බන්ධ නීතිමය කටයුතු පවත්වාගෙන යාමට සභාවේ නීති නිලධාරිනිය වෙත බලතල පවරා තිබුණද සභාවට එරෙහිව හා සභාව විසින් පවරා තිබූ නඩු සඳහා බාහිර නීතිඥවරයන් සහාය කරගෙන සමාලෝචිත වර්ෂයේදී පමණක් රු.782,500 ක් ගෙවීම්කර තිබුණි. | රාජකාරී පැවරීම පරිදි රාජකාරි ඉටු කර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### 3.3.1 සේවක ණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය තුළ,සේවය අතහැර ගිය ,මියගිය හා විශ්‍රාම ගොස් තිබූ නිලධාරීන් 36 දෙනෙකුගෙන් අයවිය යුතු උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් රු.80,739 ක් අයකර නොතිබූ අතර නිලධාරීන් 18 කගෙන් අයවිය යුතු ආපදා ණය රු.592,535 කින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු වාරිකයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වෙනස පරික්ෂා කර බලා එය නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ‘‘හරිත මිතුරු පිවිතුරු පුර’’කසළ කළමනාකරණ ව්‍යාපෘතියට බඳවාගත් සේවකයින් වෙනත් ස්ථානවලට අනුයුක්ත කර තිබීම නිසා තලාහේන පිටිපන හා බසාර් II නගර ප්‍රදේශවල කසළ ඉවත් | බඳවා ගත් කාර්ය සඳහා සේවකයන් යෙදවීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු | එක් එක් ව්‍යාපෘති අවශ්‍යතාවයන් අනුව අවස්ථානුකූලව සේවකයින් යොදවා ඇති අතර බඳවා ගත් සේවකයින් ඒ සඳහාම |

| | | | |
|---|---|---|---|
| | කිරීමේ කටයුතු පෞද්ගලික අංශයක් මගින් ඉටුකර තිබූ අතර ඒ සඳහා මාසිකව රු.2,200,000 වියදමක් දැරීමට සිදුව තිබුණි. | කළ යුතුවේ. | යෙදවීමට නොහැකි වන අවස්ථා ඇති වන බව දන්වමි. |
| (ආ) | කුරුණෑ මේජර් රාජ් ක්‍රීඩාංගනයේ පිහිටි මළ අපහරණ පද්ධතිය නැවත ක්‍රියාත්මක තත්ත්වයට පත්කිරීම සඳහා 2019 මාර්තු 25 දින ඉතිරි මුදල සඳහා ගෙවීම නිර්දේශ කර තිබුණේ මසක් තුළ ජල සාම්පල් පරීක්ෂා කිරීමෙන් අනතුරුව වුවද ජල සාම්පල් පරීක්ෂාවක් මත රඳවා ගැනීම් හා ප්‍රමාද ගාස්තු අඩුකර රු.7,012,500 ක් ගෙවීම් කර තිබුණි. 2018 සැප්තැම්බර් 14 දින වන විට ව්‍යාපෘතියේ තිබූ අඩුපාඩු 2018 නොවැම්බර් 20 වන විට නිමකරන බවට කොන්ත්‍රාත් සමාගම සමඟ එකඟව 2018 නොවැම්බර් 20 සිට 2019 නොවැම්බර් 20 දින දක්වා වගකීම් කාලයක් දක්වා ව්‍යාපෘතිය භාරදී තිබුණි. එහෙත් 2020 ජුනි 15 වන විටත් මෙම අඩුපාඩු සකස්කර නොතිබූ අතර 2020 පෙබරවාරි 24 වන විට රු.676,323 ක අලුත්වැඩියා කිරීමේ ඇස්තමේන්තුවක් ඉදිරිපත්කර තිබුණද 2016 ඔක්තෝබර් 10 දින සිට 2020 ජූනි 30 දින වන විටත් එය සාර්ථක කර ගැනීමට සභාව අපොහොසත්වී තිබුණි. | ව්‍යාපෘතියේ අඩුපාඩු සම්පූර්ණ කරවා ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුවේ. | පවතින අඩුපාඩු සකස් කරන බවට දන්වමි. |

3.5 ප්‍රසම්පාදනය
--------------

3.5.1 කොන්ත්‍රාත් පාලනය
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | --------- | ---------------------------------- |
| (අ) | දෙමහල් පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරීම<br>---------------------------------------------- | | |
| | දෙමහල් පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා රු.157,101,803 ක මුදලකට වසරකින් නිම කිරීමට ගිවිසුම්ගතවී 2016 මාර්තු 16 දින වැඩ ආරම්භ කර තිබුණි.මේ සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලින් අනුමත කර තිබූ රු. 168,000,000 ක ණය මුදලින් වාරික ගෙවීම සඳහා ලබාදී තිබූ වසර 02 ක සහන කාලය අවසන්වූ 2019 දෙසැම්බර් 31 දින වන විට ලබා ගෙන | කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කර සභාවට සිදුවූ අලාභයන් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ව්‍යාපෘතිය අවසන් කර ගැනීම සඳහා කාලය දීර්ඝ කිරීම්ද ලබාදී ව්‍යාපෘතිය නිම කර ගැනීමට උත්සහ කළද එම ඉලක්කය කරා ළඟා වීමට නොහැකිවූ හෙයින් ව්‍යාපෘතිය අවසන් කිරීමට තීරණය කරන ලද අතර ඇපකර මුදල් කර ගැනීමට අවශ්‍ය කටයුතු |

| | | | |
|---|---|---|---|
| | තිබුණේ රු.88,155,805 ක මුදලක් පමණි. කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම් අනුව ප්‍රමාද ගාස්තු අය කිරීමකින් තොරව විටින් විට කාලය දීර්ඝ කර තිබූ අතර ගිවිසුමට පටහැනිව කොන්ත්‍රාත් සමාගම හා උපදේශක ආයතනය සමඟ සාකච්ඡා කර උපකොන්ත්‍රාත් ලබා දීම සිදු කර තිබුණි. ඔවුන්ද ඉදිකිරීම අතරමග නවතා තිබුණ අතර ගිවිසුම්ගත බැඳීමක් නොමැති නිසා නීති මඟින් කටයුතු කිරීමට නොහැකිව තිබුණි. 2020 මාර්තු 11 දින ගිවිසුම අවසන් කිරීමට කටයුතු කර තිබූ අතර 2019 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් සමාගමෙන් අයවිය යුතු රු.2,427,020 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2020 ජූනි වන විටත් මෙම ව්‍යාපෘතිය නිම කර නොතිබුණි. | | සිදුකරන ලෙස බැංකුව දැනුවත් කර ඇති බව දන්වමි. |
| (ආ) | කසළ බිමට බොරළු සැපයීම හා තුනී කිරීම.<br>------------------------------------------------ | | |
| (i) | මේ සඳහා එක් පෞද්ගලික ආයතනයකින් බොරළු මිලදී ගැනීමට සහ තවත් පෞද්ගලික ආයතනයකට කසළ හා බොරළු තුනී කිරීම සඳහා ලබාදීමට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබූ අතර මුදල් කමිටුව එය අනුමත කර තිබුණි. එහෙත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධානවලට පටහැනිව තාක්ෂණික ඇගයීම් කමිටුවේ හා මුදල් කමිටුවේ තීරණ නොසලකා කසළ ඉවත් කිරීමේ ටෙන්ඩරය ලබා දුන් ආයතනයටම උක්ත කාර්යයද ලබා දීමට සභාව කටයුතු කර තිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටු තීරණ කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කරවමි. | එකම ආයතනයක් වෙත පැවරීමෙන් ඵලදායි සේවාවක් ලබාගත හැකි බව 2019 අප්‍රේල් සභා සම්මුතියෙන් පිළිගෙන ඇති බව දන්වමි. |
| (ii) | ගිවිසුම් ප්‍රකාරව කසළ මත අඟල් 4- 6 ත් අතර බොරළු තට්ටුවක් මනාව ඇතිරීම සඳහා 2019 ජනවාරි සිට ජූනි දක්වා රු.7,110,632 ක් වැයකර තිබුණි. බොරළු සැපයීම සම්බන්ධයෙන් ලේඛන හෝ වාර්තා පවත්වාගෙන ගොස් නොතිබූ අතර කිසිදු නිලධාරියෙකුගේ අධීක්ෂණයකටද ලක්ව නොතිබුණි. | කසළ අංගනයේ නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ලේඛන පවත්වා ගත යුතුවේ. | මේ පිළිබඳව සභාවේ අවධානය යොමු කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.5 අයවීමට ඇති අධිභාර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 226(1) විධිවිධාන යටතේ වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව 2006 වර්ෂයේ සිට මවිසින් පනවන ලද අධිභාරවලින් 2019 දෙසැම්බර් 31 දිනට අය කර ගැනීමට ඇති මුදල රු.2,403,614 ක් විය. | අධිභාර අයකර ගත යුතුවේ. | අදහස් දක්වා නෙැමැත. |

3.6 වත්කම් කළමනාකරණය

3.6.1 නිශ්ක්‍රීය වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2017 වර්ෂයේදී ලැබුණු වටිනාකම රු. 17.819,076 ක්වූ යන්ත්‍ර 07 ක් ලැප්ටොප් වර්ගයේ පරිගණකයක් හා වටිනාකම දක්වා නොතිබූ වයිබ්‍රේටින් මාර්ග තලනය නිශ්කාර්යව පැවතුණි. | වත්කම් භාවිතයට ගත යුතුවේ. | නිකුත් නොවී ඇති ගබඩා භාණ්ඩ කඩිනමින් ලබා දීමත් කාර්යයන් සඳහා යෙදවීමටත් කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2018 වර්ෂයේ මිලදී ගෙන තිබූ වටිනාකම රු.9.279,600 ක් වූ ට්‍රැක්ටරයක් පාවිච්චි කර නොතිබූ අතර 2018 වර්ෂයේ ලැබී තිබූ කම්පැක්ටර් රථයක් හා 2017 දෙසැම්බර් පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ Compost pellet යන්ත්‍රයද නිශ්කාර්යව පැවතුණි. | වත්කම්වලින් උපරිම ඵලදායිකත්වය ලබා ගත යුතුවේ. | නිකුත් නොවී ඇති ගබඩා භාණ්ඩ කඩිනමින් ලබා දීමත් කාර්යයන් සඳහා යෙදවීමටත් කටයුතු කරන බව දන්වමි. |

4. ශිනුම්කටයුතු භාවය හා යහපාලනය

4.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම ඉකුත් වර්ෂය අවසානයේ පිළියෙල කළ යුතුවේ. | 2019 අගෝස්තු 01 දි මහා සභාව වෙත යොමු කර අනුමැතිය ලැබී ඇති බව දන්වමි. |

4.2 පිළිතුරු නොලත් විගණන විමසුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 ගිණුම් වර්ෂය සඳහා නිකුත් කර තිබූ විගණන විමසුමකට හා 2019 ගිණුම් වර්ෂය සඳහා නිකුත් කර තිබූ විගණන විමසුම් 02 කට 2020 ජූනි 30 දින වන විටත් පිළිතුරු ලැබී නොතිබුණි. | කඩිනමින් පිළිතුරු ලබා දිය යුතුවේ. | ඉදිරියේදී ලබා දීමට කටයුතු කරන බව දන්වමි. |